සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| මගේ අංකය / எனது இல / My No | DSD/HO/04/ER/Circular/2021 | ඔබේ අංකය / உமது இல / Your No | ........................ | දිනය / திகதி / Date | 2021.08.16 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත,

**සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් ( 200,000 ක්) කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2021 - ධීවර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

සමෘද්ධි පවුල් ලක්ෂ 200,000 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ධීවර ක්ෂේත්‍රයට අදාළව මේ වනවිට දිවයින පුරා ප්‍රතිලාභීන් 5,976 ගේ තොරතුරු CRM මොඩියුලයට ඇතුලත් කර ඇත.

02. ඔබද දැණුවත් පරිදි ධීවර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය හරහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 270 ක ප්‍රතිපාදන මේ වන විට ලබාදී ඇති අතර එම ආයතනය විසින් මේ වන විට සමෘද්ධි නිලධාරින් හා සම්බන්ධ වෙමින් යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව කටයුතු කරමින් සිටියි.

03. මෙහිදී යෝජිත ව්‍යාපෘති අතුරින් එම ආයතනයේ විෂය ක්ෂේත්‍රයට අදාලව පහත සඳහන් ව්‍යාපෘති වර්ග 11 ට අයත් ව්‍යාපෘති සඳහා පමණක් ඉහත ප්‍රතිපාදන වෙන් කරනු ලබන බව එම අධිකාරිය විසින් අප වෙත පෙන්වා දී ඇත.

I. පොකුණු තුල මසුන් වගාව
II. කුඩා පරිමාණ විසිතුරු මත්සය වගාව
III. මුහුදු පැලෑටි වගාව
IV. ජලාශවල දැල් කූඩු තුල මසුන් වගාව
V. විසිතුරු මත්සය වගාව වැඩිදියුණු කිරීම
VI. විසිතුරු මසුන් අලෙවි සැල් වැඩිදියුණු කිරීම
VII. කුඩා පරිමාණ මත්සය ආහාර නිෂ්පාදන ඒකක පිහිටුවීම
VIII. මත්සය බීජ නිෂ්පාදන ඒකක වැඩිදියුණු කිරීම
IX. කූඩු තුල මෝදා මසුන් වගාව
X. මිරිදිය දූම් / ලුණු කරවල සැකසීම
XI. යාත්‍රා හා ධීවර ආම්පන්න නවීකරණය / අළුත්වැඩියාව.

04. එබැවින් ඉහත සඳහන් ව්‍යාපෘති වර්ග 11 ට අමතරව ඇති ධීවර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඔබ වෙත පැවරෙන අතර දිස්ත්‍රික් / ප්‍රාදේශීය ජලජීවී නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් හා නිර්දේශයෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත මේ වන විටත් ලබා දී ඇති ප්‍රතිපාදන යොදා ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. එමෙන්ම 2021.07.07 දින දක්වා CRM පරිගණක මෘදුකාංගය හරහා ඇතුලත් කරන ලද ඔබ දිස්ත්‍රික්කයෙන් යෝජිත ධීවර සංවර්ධන ව්‍යාපෘති නාම ලේඛණ ඔබ වෙත හා එම ආයතනය වෙතද ලබා දී ඇති බැවින් දිස්ත්‍රික් ජලජීවී නිලධාරින් හා ඒකාබද්ධ වෙමින් යෝජිත ව්‍යාපෘති නාම ලේඛණය ඉහත අංක 03 ට හා 04 ට අදාලව හඳුනා ගැනීමට කටයුතු කිරීම මැනවි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2872202
Fax - 011-2889002
E-mail- dg@samurdhi.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
0112872202
Hot Line: 011- 28877

06. එමෙන්ම 2021.05.09 දින දක්වා CRM පරිගණක මෘදුකාංගය හරහා ඇතුලත් කරන ලද ඔබ දිස්ත්‍රික්කයෙන් යෝජිත කරදිය ධීවර ව්‍යාපෘති වලට අදාළව හඳුනාගත් ප්‍රතිලාභී නාමලේඛන සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ඔවුන්ගේ නිර්දේශය ලබා දී ඇති අතර එම දිස්ත්‍රික්කයන්ට අදාල නාම ලේඛනයන්හි මෘදු පිටපතක්ද මේ සමඟ ඔබ වෙත ලබාදීමට කටයුතු කරමි.

07. කෙසේ වුවද සෑම ව්‍යාපෘතියක් සඳහාම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිර්දේශය අත්‍යවශ්‍ය බව වැඩිදුරටත් කාරුණිකව පෙන්වා දෙමි.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ සියළු දෙනා දක්වන සහාය අගය කරමි.

Covid -19 වසංගත තත්ත්වය දක්වා වර්ධනය වීම පාලනයට සෞඛ්‍ය, ආරක්ෂක අංශ ලබාදී ඇති උපදෙස් අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බව ද කාරුණිකව දන්වමි.

ආර්.පී.ති. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :- 1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි

2. ලේකම් - ජාතික ජීවනෝපාය සම්බන්ධීකරණ අනු කමිටුව - කා.දැ.ගැ.පි

3. ලේකම් - විසිතුරු මසුන්,මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම,ධීවර වරාය සංවර්ධන බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍යඅමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.හා අ.ක.ස

4. . ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ගැ.පි.

5. අධ්‍යක්ෂ ජනරාල් -ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.

6. අධ්‍යක්ෂ ජනරාල් - ධීවර හා ජලජ සම්පත්දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.